18705

සියලු ම හිමිකම් ඇවිරිණි.

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## වර්ෂ අවසාන පරීක්ෂණය - 2003
## ගණිතය

**6 ශ්‍රේණිය**

**නම/විභාග අංකය:-** ..............................................................................................

**කාලය:- පැය 01 විනාඩි 30 යි.**

---

**I කොටසේ ප්‍රශ්න සියල්ලටත් II කොටසේ ප්‍රශ්න 5 කටත් පිළිතුරු සපයන්න.**

## I කොටස

(01) O O  OO  OO   OOO
O OO  OO  OOO  OOO

**මෙහි ඇති සෘජුකෝණාස්‍ර සංඛ්‍යා තෝරා ඇඳ දක්වන්න.**

(02) $\frac{4}{100}$ දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(03) 1, 2, 3, 4, 5, 6 සංඛ්‍යා අතුරින් ප්‍රථමක සංඛ්‍යා සියල්ල තෝරා ලියන්න.

(04) 4 5 □   මෙහි දක්වෙන්නේ ඉලක්කම් තුනකින් යුත් සංඛ්‍යාවකි. මෙම සංඛ්‍යාව කුඩාතම ඉරට්ට සංඛ්‍යාව වීමට හිස්තැනට ගැලපෙන ඉලක්කම කුමක්ද?

(05) 2.5 - 0.8 සුළු කරන්න.

(06) සුපුන්, කසුන්ට වඩා වැඩිමහල් වන නමුත් නිපුනට වඩා බාලය. වයසින් වැඩිතම කව්ද?

(07) 1 Kg 750g හා 2 Kg 50g යන බර ප්‍රමාණ දෙක < හෝ > යොදා නිවැරදිව දක්වන්න.

(08) පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 54.80 කි. පෙට්‍රල් ලීටර් $1\frac{1}{4}$ ක මිල කීයද?

(09) මීටර් 2 ක් ද, මීටරයකින් $\frac{1}{10}$ ඒවා 4 ක්ද, මීටරයකින් $\frac{1}{100}$ ඒවා 5 ක්ද, එක්ව ගත්කල ලැබෙන මුළු දිග මීටර් වලින් දක්වන්න.

(10) සෘජුකෝණාස්‍රයක පරිමිතිය 40 cm කි. එහි පළල 8cm නම් දිග කීයද?


(11) 47 × 8 ගුණිතය ලබා ගැනීමට උදව්වන ප්‍රකාශනය පහත පිළිතුරු අතරින් තෝරා ලියන්න.
(i) (4 × 8) + (7 × 8) (ii) (40 × 8) + (7 × 8) (iii) (4 × 8) + (70 × 8)

(12) 2, 4, 5 යන සංඛ්‍යා තුනෙන්ම බෙදිය හැකි කුඩාතම සංඛ්‍යාව කුමක්ද?

(13) මාලි ගේ මුද්දර පොතේ එක් පිටුවක මුද්දර 20ක් ඇලවිය හැකිය. මුද්දර 480 ක් ඇලවීමට පිටු කීයක් අවශ්‍ය වේද?

(14) කැට දෙකක මුදල් අතර අනුපාතය 40 : 100 කි.
මෙම අනුපාතය සරල ම ආකාරයෙන් දක්වන්න.

(15)




ඉහත සංඛ්‍යා රේඛාවෙහි නිපුනගේ හා කසුන්ගේ වයස අවුරුදුවලින් දක්වේ. නිපුනගේ වයස A ලක්ෂ්‍යයෙන් ද, කසුන්ගේ වයස B ලක්ෂ්‍යයෙන්ද නිරූපනය වේ.
වඩා වැඩිමහල් කවුද?
අවුරුදු කීයකින් වැඩිමහල්ද?

## II කොටස

**ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) 1997 වසරේ රජයේ පාසල්වල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 4053610 ක් බැව් පුවත්පතක සඳහන් විණි.

(i) මෙම සංඛ්‍යාව කලාප වෙන් කරමින් ලියා දක්වන්න.

(ii) මෙම සංඛ්‍යාව වචනයෙන් ලියා දක්වන්න.

(iii) මෙහි 3න් දක්වෙන අගයත්, 6න් දක්වෙන අගයත් අතර වෙනස කීයද?

(iv) මෙම සංඛ්‍යාවේ ඉලක්කම් සියල්ල යොදගෙන සෑදිය හැකි විශාලතම සංඛ්‍යාව කුමක්ද?

(v) 3, 5, 4, 6 අංක හතර, එකවර බැගින් යොදගෙන සෑදිය හැකි කුඩාතම ඉරට්ට සංඛ්‍යාව කුමක්ද?

(vi) 3, 5, 4, 6 අංක හතර එකවර බැගින් යොදගෙන සෑදිය හැකි විශාලතම ඔත්තේ සංඛ්‍යාව කුමක්ද?

(02) (A) මාලිගේ මව අමුත්තන්ට සංග්‍රහ කිරීමට දිවුල් කිරි පිළියෙල කළාය. එහි ලීටර් 1 හි බෝතල් 2 ක් ද මිලි ලීටර් 100 බඳුනකින් 6 ක් ද ඇති බව මාලි සොයා ගත්තාය. අමුත්තන්ට සංග්‍රහ කිරීමට වැය වූයේ දිවුල් කිරි ලීටර් 1ක් හා මිලිලීටර් 550 ක් පමණි.

(i) මාලිගේ අම්මා පිළියෙල කළ දිවුල් කිරි ප්‍රමාණය ලීටර් හා මිලි ලීටර්වලින් කොතෙක් ද?

(ii) එම දිවුල් කිරි ප්‍රමාණය ලීටර්වලින් ප්‍රකාශ කරන්න.

(iii) සංග්‍රහ කිරීමෙන් පසු ඉතිරි වූ දිවුල් කිරි ප්‍රමාණය ලීටර්වලින් දක්වන්න.

(iv) ඉතිරි දිවුල් කිරි ප්‍රමාණය මිලි ලීටර් කීයද?

(B) මාලිගේ මව පොළෙන් මිලටගත් ගෝවා ගෙඩියක් තරාදියෙන් කිරන විටදී අනෙක් තරාදි තට්ටුවේ දමා තිබුණේ 1kg පඩිය හා 50g පඩිය පමණි.

(i) ගෝවා ගෙඩියේ බර ග්‍රෑම් කීයද?

(ii) ගෝවා ගෙඩියේ බර කිලෝ ග්‍රෑම්වලින් කීයද?

(iii) ගෝවා ගෙඩියේ බර, 1.5 Kg ට වඩා කොතෙක් අඩුද?

(03) රන්දුල රුපියල් 2 කාසි කැටයකට දමමින් මාසයක් තුළ එකතු කළ ආකාරය මෙසේය.

| 1 දින | 2 දින | 3 දින | 4 දින | 5 දින |
|---|---|---|---|---|
| ② | ②② | ②②② | ②②②② | ...................... |

**එක් එක් දිනය අවසානයේ කැටයේ එකතුවන කාසි ගණන හා මුදල්වල එකතුව වගුවේ දක්වා ඇත.**

| දිනයේ අංකය | එකතුවන කාසි ගණන | එකතුවන මුදල රුපියල් |
|---|---|---|
| 1 | 1 | 2 |
| 2 | 3 | 6 |
| 3 | 6 | 12 |
| 4 | 10 | ☐ |
| 5 | ☐ | ☐ |
| 6 | ☐ | ☐ |
| 7 | ☐ | ☐ |
| ...... | ........ | ...... |
| ...... | ........ | ...... |
| 10 | ☐ | ☐ |

To download past papers visit
www.vajirapani.blogspot.com

(i) 7 දිනය තෙක් වගුව පුරවන්න.

(ii) කැටයේ එකතුවන කාසි ගණනත්, කැටයේ එකතුවන මුදලත් අතර සම්බන්ධය කුමක්ද?


(iii) කැටයේ එකතුවන කාසි ගණන සඳහන් සංඛ්‍යා රටාව කවර වර්ගයේ සංඛ්‍යා රටාවක්ද?

(iv) 1 + 2 + 3 + 4 = 10 යන සම්බන්ධය වගුවේ තොරතුරු සමඟ සසඳ <u>දින තීරයේ අංක</u> හා <u>කැටයේ එකතුවන කාසි ගණන</u> අතර සම්බන්ධය ඔබේ වචනයෙන් ලියන්න.

(v) 10 වැනි දිනය අවසානයේ එකතුවන කාසි ගණන කීයද?

(vi) 10 වැනි දිනය අවසානයේ කැටයේ එකතුවන මුදල කීයද?

(04)(A) රූපයේ දක්වා ඇති පරිදි පහත් මිනුම් සහිත ඝනකාභයක් මේසයක් මත තබා ඇත.




To download past papers visit
www.vajirapani.blogspot.com

(i) මේස ලෑල්ල මත ගැටෙන ඝනකාභයේ මුහුනතේ හැඩය කුමක්ද?

(ii) එහි දිග හා පළල වෙන වෙනම ලියා දක්වන්න.

(iii) මෙම ඝනකාභයේ පෙනෙන්ට ඇති සිරස් දර ගණන කීයද?

(iv) මෙම ඝනකාභයේ පෙනෙන නොපෙනෙන සිරස් දර කීයක් තිබේද?

(v) මෙම ඝනකාභයේ පෙනෙන්ට ඇති ශීර්ෂ ගණන කීයද?

(vi) මෙම ඝනකාභයේ පෙනෙන නොපෙනෙන මුළු තිරස් දර ගණන කීයද?

(B) ඉර බසින දිශාවට හැරී බලා සිටින නිමල්ගේ සෙවනැල්ල පොළොව මත වැටී ඇති ආකාරය ඔහුගේ යහළුවා බලා සිටී. නිමල්ගේ යහළුවා ඔහුගෙන් ප්‍රශ්න දෙකක් අසනු ලබයි.

(i) නිමල්ගේ සෙවනැල්ල වැටී ඇති දිශාව කුමක්ද?

(ii) නිමල්ගේ වම් අත පිහිටි දිශාව හා සෙවනැල්ල වැටී ඇති දිශාව අතර දිශාව කුමක්ද?

ඉහත ප්‍රශ්න දෙකින් විමසන දිශා වෙන වෙනම ලියන්න.

(05) සෘජුකෝණාස්‍රාකාර පාත්ති තුනක දිග සහ පළල පිළිබඳ තොරතුරු මෙසේය.

| පාත්තිය | දිග m | පළල m |
|---|---|---|
| 1 වැනි | 16 | 4 |
| 2 වැනි | 12 | 6 |
| 3 වැනි | 15 | 5 |

(i) වර්ගඵලයෙන් විශාලම පාත්තිය කුමක්ද? එහි වර්ගඵලය කොපමණද?

(ii) වර්ගඵලයෙන් කුඩාම පාත්තිය කුමක්ද? එහි වර්ගඵලය කීයද?

(iii) එක් එක් පාත්තියේ දිග සහ පළල, $\frac{\text{පළල}}{\text{දිග}}$ ලෙස දක්වූ විට ලැබෙන භාග තුන පිළිවෙලින් ලියන්න.

(iv) ඉහත (iii) න් ලබාගත් භාග තුන සරලම ආකාරයෙන් දක්වන්න.

(v) ඔබ (iv) හිදී සරලම ආකාරයෙන් ලබාගත් භාග තුන අයත්වන භාග කුමන නමකින් හැඳින්වේද?

(vi) ඔබ ලබාගත් භාග තුනෙන් පළමු භාග දෙකේ එකතුව කීයද?

(06) චමරි ඇයගේ වත්තේ විලාඩ් අඹ ගසෙන් කඩාගත් අඹගෙඩි ටිකක් බෑගයකට දමා යහළුවන්ට තෑගි දීමට රැගෙන ගියාය. එම අඹගෙඩි ප්‍රමාණය Y යයි සිතමු. පසුව ඇය. කොටසක් ඉතිරිව තබාගෙන ගයනිට ගෙඩි 8 ක් දුන්නාය. මේ අනුව

(i) $Y = 8$, $Y < 8$, $Y > 8$ යන සම්බන්ධතා අතරින් කුමක් නිවැරදි වියයුතුද?

(ii) බෑගයේ ඉතිරි වූ අඹ ප්‍රමාණය දක්වීමට "Y" අඩංගු ප්‍රකාශනයක් ලියා දක්වන්න.

(iii) බෑගයේ ඉතිරි වූ අඹ ප්‍රමාණය 16 ක් වී නම්, Y, 8 සහ 16 අතර සම්බන්ධයක් ලියා දක්වන්න.

(iv) (iii) හි ඔබ ලියන ලද සම්බන්ධය සත්‍යවීමට Y හි අගය සොයන්න.

(v) ගයනි විසින් චමරිට පෙරලා "ගිරා" වර්ගයේ අඹගෙඩි 12 ක් තෑගි කරන ලදී. චමර ඒවාද තම බෑගයට දම්මාය. දැන් බෑගය තුළ ඇති අඹගෙඩි ගණන දක්වීමට Y අඩංගු ප්‍රකාශනයක් ලියන්න.

(07) රූපවාහිනියේ ප්‍රචාරය වන "රජ ඉබ්බෝ" කාටූන් වැඩසටහන ආරම්භයේදී වේලාව 1730 h ලෙස රූපවාහිනී තිරයේ දිස්විය. ඉන්පසු ගුවන් විදුලියේ "මුවන්පැලැස්ස" නාට්‍යය ආරම්භයේදී නිවේදකවරයා විසින් වේලාව පස්වරු අට පසු වී මිනිත්තු තිස්පහක් බව ප්‍රකාශ කරන ලදී.

(i) "මුවන් පැලැස්ස" නාට්‍යය ආරම්භ කළ වේලාව අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියන්න.


(ii) "රජ ඉබ්බෝ" රූපවාහිනී වැඩසටහන ආරම්භ කල වේලාව සාමාන්‍ය ඔරලෝසු වේලාවෙන් ලියා දක්වන්න.

(iii) රූපවාහිනී වැඩසටහන මිනිත්තු 40 ක් තුළ ප්‍රචාරය වී නම් එය අවසන් වූ වේලාව අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියන්න.

(iv) රූපවාහිනී වැඩසටහන ආරම්භයේ සිට ගුවන්විදුලියේ "මුවන්පැලැස්ස" නාට්‍යය ප්‍රචාරය වීම ආරම්භ වන තෙක් ගතවූ කාලය කොපමණද?

(v) රූපවාහිනී වැඩසටහන ආරම්භ වූ 1730 h යන වේලාව කියවන ආකාරය වචනයෙන් ලියන්න.

(08) වෙහෙරගොඩැල්ල පාසලේ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වූ සිසුන් පිළිබඳ දත්ත සමූහයක් පහත රූපයේ තීර ප්‍රස්තාරයෙන් දක්වේ.




To download past papers visit
www.vajirapani.blogspot.com

ඉහත ප්‍රස්තාරය ඇසුරින් පහත දක්වෙන තොරතුරු සපයන්න.

(i) වැඩිම සිසුන් සංඛ්‍යාවක් සමත් වූ වර්ෂය හා සිසුන් ගණන

(ii) අඩුම සිසුන් සංඛ්‍යාවක් සමත් වූ වර්ෂය සහ සිසුන් ගණන

(iii) සමාන සිසුන් සංඛ්‍යාවක් සමත් වූ වර්ෂ

(iv) 1996 සමත් වූ මුළු සිසුන් ගණන

(v) 1995 සිට 2000 තෙක් සමත් වූ මුළු සිසුන් ගණන

(vi) 1995 ට වඩා කොපමණ සිසුන් සංඛ්‍යාවක් 1998 දී සමත් වී ඇත්ද?